

ගල්නෑව ගොවි ගම්මානයක ඉදිවෙන නිවහනක්.

# ශලි පිබිදෙන කලාවැව නිම්නය

කලාවැවේ මහ වැව් කණ්ඩිය මතු පිට දිවෙන මාර්ගයකි. එය ඔස්සේ වාන පසු කර ටික දුරක් යන විට දකුණට හැරෙන බොරළු පාරක් වේ. මෙය ජේන තෙක් මානයේ දුරට වැටී තිබේ. එහි සැතපුම් තුනක් පමණ ගිය තැන ගල්නෑව ගමේ මහවැලි සංවර්ධන මණ්ඩලයේ කාර්යාලයක් වේ. ගල්නෑව 'එච්' ප්‍රදේශවල ප්‍රධාන පාලක මධ්‍යස්ථානයකි. කට්ටි 6,000 කට ආසන්න සංඛ්‍යාවකින් සෑදී ගොඩ ඉඩම් අක්කර 3,200කින් පමණ ද, කට්ටි 4,200 කින් පමණ සෑදි කුඹුරු අක්කර 9,700 ක් පමණ ද එහි පාලනයට හසු වේ.

**පුරෝගාමීන්:-** එදා වල් අලින් ගැවසුණු රූස්ස වනාන්තර තිබුණ මෙහි දැන් කෙමෙන් කෙමෙන් නිල්ලගැසී නැඟී එන කුඹුරු යාය සෑම තැනම දිස්වේ. පොල් අතු වලින් හෙවිලි කළ, වරිච්චිවලින්තැනූ තාවකාලික නිවෙස් සිය දහස් ගණනක් ප්‍රදේශය පුරා විසිරී ඇත. මේවායේ වාසය කරන්නේ මහවැලියේ මූලික සංවර්ධන ප්‍රදේශය තුළ පදිංචි වූ ගොවියන් ය. ඔවුන් පුරාණ ගම්වලිනුත්, ඒවගේම අඹන්ගඟ බෝවතැන්නෙන් හැරවීම නිසා ඉවත් කළ ගම්වලිනුත්, තෙල්දෙණිය ආදී ප්‍රදේශවලිනුත් පැමිණි පුරෝගාමී ජනපදිකයින් ය.

කැලේ හෙළි පෙහෙළි කල මේ ප්‍රදේශයට මුලින්ම පැමිණියේ ගොවීන් පමණි. ඔවුනට මාස දෙකක් පමණ යන තුරු තමා ගේ බිම් කට්ටිවල ගල්මුල් ගලවා බිම් අස්වද්ද ගැනීමටත්, පැල්පත් නිවාස තනාගැනීමටත් සිදුවිණි. ඒ පැල්පතක් තනා ගැනිමේ මූලික වියදම් දැරීමට රු. 100/- ක මුදලකුත්, උදැල්ලක්, අලවංගුවක් සහ පොරොවක් යන ආම්පන්නත්, පළමු වැනි අස්වැන්න ගන්නාතෙක් මසකට රු. 50ක දීමනාවක් ද සමග මහවැලි සංවර්ධන මණ්ඩලයෙන් ලැබුණි. මේ අවස්ථාව වූ විටයි, ඔවුන්ට සිය අඹුවන් හා දරු පැටවුන් කැටුවවිත් පදිංචි වීමට අවස්ථාව ලැබුවේ.

## බිම් කට්ටි

පළමුවැනි අස්වැන්න කපා ගැනීම උදෙසා ඔවුන් බොහෝ වෙහෙස මහන්සියෙන් කටයුතු කළයුතුව තිබුණි. එහිදී අවශ්‍ය නියරවල් තනා ගැනීමට අඩියකට ශත 20 ක් බැගින් වූ මුදලක් අඩි 3,500 ක් දක්වා ද, ලියදි මට්ටම් කර ගැනීමට අක්කරයකට රු. 500ක්ද, ඔවුන්ට ලැබුණි. ඒවාගේ ම වගා කරන බීජ පළමු වැනි කන්නය තුළ නොමිලයේම වාගේ සැපයුන අතර, පෝර, කෘමි නාශක, යන්ත්‍ර උදෙසා සමූපකාර ණය ක්‍රමයක් ක්‍රියාත්මක විණි. තවද, ගොවීන් 5,10 කාණ්ඩ සංවිධානයවී පොදු කටු කම්බි වැටවල් ගැසීම මේ කාලය තුළ ම සිදු කරන ලදී.

**ගොඩ බිම් ඒකක:-** මහවැලි ව්‍යාපාරයෙන් කලාවැව ප්‍රදේශයේ වාරිමාර්ග ජලය හිඟය

තුරන් කරලීමට හැකි වුණි. සෑම පළාත් වැසියකුටමත් ප්‍රමාණවත් ආදායමක් ලබා දෙන අක්කර $2\frac{1}{2}$ ක කුඹුරු කට්ටියක්, නිවාසයක් තනා ගැනිමට අක්කර $\frac{1}{2}$ ක බිම් කැබැල්ලක් එහි දී ලබා දෙන ලදී. මහවැලි සංවර්ධන ව්‍යාපාරය මේ පළාත්වල ඇරඹීමට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව කළ සමීක්ෂණයකදී ප්‍රදේශවාසීන් ප්‍රශ්න රැසකට මැදිව සිටි බව පෙනී ගොස් තිබුණි. 1973/74 මහ කන්නයේ දී ප්‍රදේශයේ පැවති ප්‍රධාන ජනපද ව්‍යාපාරවල හා පුරාණ ගම්වල පුද්ගලයෙකුට තිබූ සාමාන්‍ය කුඹුරු ප්‍රමාණය අක්කර 1/4 කට ස්වල්පයක් වැඩිවුණි. මෙය කිසියේත් ප්‍රමාණවත් ආදායමක් ලබාදෙන ගොවි පල ඒකකයක් නොවේ. අනික් අතට ජිතර පැවැති වාරිමාර්ග ජලය හිඟය, විශේෂයෙන් පුරාණ ගම්වල ඉඩම් ඉතා කුඩා කට්ටිවලට බෙදී ගොස් එකම යායේ වුව ද තැනින් තැන විසිරී පැවතීම, කන්න පමාවීම, විවිධ වයසේ ගොයම්, වගා අත්හැරලීම්, ආදී ප්‍රශ්න ගණනාවක් වූයේය. මේ තත්වය නිසා එම කන්නයේ ඇත්ත වශයෙන්ම වගා කළ බිම් ප්‍රමාණය සාමාන්‍ය එක් පවුලකට නම් අක්කර එකක් පමණ ද පුද්ගලයෙකුට නම් අක්කර 1/5 ක් පමණ ද වූයේ ය. මෙය ප්‍රදේශවාසීන් වැඩිදෙනා වී ගොවිතැනට වඩා හේන් කෙටීමට කැමැත්තක් දක්වීමට හේතුවීය. නමුත් ගම්වල ජනගහණය වැඩිවීම නිසා හේන් කොටන්නට තරම් මේරූ කැලෑබද පෙදෙස් ළඟ පාත නොවූයෙන් හේන් සොයා සැතපුම් 7 ,8 යෑමට සිදුව ඇත. මහවැලි සංවර්ධන ව්‍යාපාරය ඇතිවීමත් සමඟ පුරාණ ගම්වාසීන්ට ඔවුන් ගේ පවුලේ ගෘහ මූලිකයාට කුඹුරු අක්කර 2 1/2 ක්ද, එම පවුලේ අවුරුදු 18 වැඩි සෑම පුද්ගලයෙක්ට ම අක්කර 2 1/2 බැගින්ද ලැබීම නිසා කලින් සඳහන් කළ ප්‍රශ්න ගණනාවක් ම විසඳී, කන්න දෙකම වගා කිරිමට වාරිමාර්ග ජලය ලැබීමෙන් ආදායම්ද දෙගුණ තෙගුණ විය. එපමණක්නොව, තරුණ පරපුරේ රැකියා ප්‍රශ්නය ඉබේම වාගේ විසඳී ගියේ ය.

# පවුල් සුවසෙත

පවුල් සෞඛ්‍යය: ජනපදවාසීන් උදෙසා පවුල් සෞඛ්‍යය පිළිබඳව, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ පවුල් සංවිධාන සංගමය මගින් වැඩසටහන් ගණනාවක් ප්‍රජා සංවර්ධන අංශයේ මෙහෙය වීමෙන් ක්‍රියාත්මක කර තිබේ. මේ ප්‍රදේශයේ පවුලක් සාමාන්‍යයෙන් හයදෙනෙකුගෙන් යුක්ත වේ යැයි සමීක්ෂණයකින් හෙළි වී ඇත. ජනගහණයෙන් තුනෙන් දෙපංගුවක වයස අවුරුදු 25 ට අඩු ය. ළදරුවන් පෝෂණය, පවුල් සංවිධානය, පවුල් සෞඛ්‍යය වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහි ලා විශේෂ ලක්ෂණයක්ව ඇත්තේ ජනපදවාසී ස්වේච්ඡා සේවකයින් 80ක් මෙහි නියාමකයන් වීමය. මේ උදෙසා මහවැලි ප්‍රජා සංවර්ධන අංශය ගන්නා උත්සාහය ප්‍රශංසනීය යි. ළදරුවන් හා ගැබිණියන් උදෙසා ද ශායන (ක්ලිනික්) දැන් ආරම්භ කොට ඇත.

## පවුල් බර

ඇතැම් මහා ජනපද ව්‍යාපාරවල පවුල් සංවිධාන වැඩ සටහන් ප්‍රමාණවත් අන්දමින් ක්‍රියාත්මක නොවීම ඒ ප්‍රදේශවල ජනපදවාසීන්ට විශාල පවුල් බරක් දැරීමටත් හා ඒ හේතුකොට ගෙන මතුවූ නොයෙක් ප්‍රශ්නවලට මුහුණ පෑමටත් හේතු වී ඇත. දැරිය හැකි පවුල් බරකින් යුතු පවුල් ජීවිතයක් සංවිධානය කර ගැනීමට ජනපදවාසීන්ට උපදෙස් හා ආධාර ලබා දීමටත්, එමඟින් ළදරු සෞඛ්‍ය, පෝෂණය යනාදිය ක්‍රමවත් අන්දමින් කරවීමත් දූරදර්ශී වැඩ පිළිවෙළක් සංවිධානය කර ගැනීමත් මෙයින් අපේක්ෂා වේ. මේ මගින් පවුල් සංවිධාන ශායන ගල්නෑව ප්‍රදේශයේ ක්‍රියාත්මක වූනඅතර, දැන් ප්‍රදේශයේ තෝරාගත් ස්ථානවල ජංගම ශායන පැවැත්වීමට කටයුතු සලස්වා ඇත.

දැනට මෙම වැඩ සටහන මසකට දෙවරක් පමණ ක්‍රියාත්මක වේ. නියමිත ස්ථානවල රැස් කරවන පිරිස්වලට පවුල් සංවිධානයේ ඵල ප්‍රයෝජන ගැන වැටහීමක් ලබා දීම අරමුණු කොට ඇති ප්‍රචාරක කටයුතු මගින් ඔවුන් දිරි ගන්වයි. මේ අනුව 1978 ජුලි මාසය තුළ පමණක් පුරුෂ සැත්කම් 150 ක් පමණ කිරීමට කටයුතු යොදා තිබේ. ස්ත්‍රීන් උදෙසා සැත්කම් ද මේ මස සිට ආරම්භ කිරීමට අදහස් කර ඇත.

## මැලේරියා

වියළි කලාපයේ මැලේරියා උණ නැවතත් හිස එසවීමේ තර්ජනය මේ ප්‍රදේශවලද පැතිරුන හෙයින් මහවැලි සංවර්ධන මණ්ඩලය හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව එක්ව ප්‍රබල මැලේරියා මර්ධන ව්‍යාපාරයක් දියත් කර ඇත. මදුරු නාශක බෙහෙත් ඉසීම පමණක් නොව, ස්වේච්ඡා ප්‍රතිකාර මධ්‍යස්ථාන 40 ක් පමණ ද ආරම්භ කර ඇත.

# මහජන බැංකු සේවා

**පවුලේ අයවැය:** කෘෂිකර්මය නංවාලීමට රජය මගින් වැඩි දියුණු බීජ සැපයීම, පෝර නිර්දේශ කිරීම යනාදී නොයෙකුත් කෘෂිකර්ම ව්‍යාප්ති සේවාවන්ද සහතික මිළ, ආධාර ගොවි රක්‍ෂණ යනාදියද ක්‍රියාත්මක කෙරේ. මේ නිසාවෙන් ගොවි ආදයම් ඉහළ ගොස් ඇත. බොහෝ කාල යක් හුදෙක් යැපීම උදෙසා ගොවිතැන් කළ ගොවීන් දැන් අතිරික්ත විකුණා ලබන මුදල් ප්‍රමාණය විශාලය. මෙහි අක්කරයකට බුසල් 80-100 දක්වා වූ අස්වැන්නෙහි සාමාන්‍යය නිසා ගොවිපල ඒකකයක කන්නයකට බුසල් 200 ක් පමණ නිපදවේ. වෙළඳ පොළ මිළ අනුව මෙහි වටිනාකම රු. 8,000-9000ක් පමණ වේ. සාමාන්‍යයෙන් ගොවියකු අතට අවුරුද්දකට දෙවරක් ලැබෙන මෙබඳු විශාල මුදලක් පරිහරණය කිරීමට අවශ්‍ය ශික්‍ෂණය හා දැනුමක් ඔහු වෙත වේද? මෙය අද මහවැලියේ ප්‍රජා සංවර්ධන අංශයේ විසඳුමට ලක් වී ඇති කරුණකි.

**බැංකුවල සහාය**– දැන් මහජන බැංකුව, හා ලංකා බැංකුවත් මහවැලි සංවර්ධන මණ්ඩලයේ සම්පූර්ණ සහයෝගය ඇතිව ප්‍රදේශයේ ගොවීන් උදෙසා ක්‍රමවත්ව මුදල් පරිහරණය කිරීමට ඉඩ සැලසීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබේ. ඉන් එකවැඩ සටහනක් නම් ඉතිරිකිරීමේ ව්‍යාපාරයයි. ඇත්තවශයෙන් දැනට ප්‍රදේශයේ ජනපදිකයින් 60%ක් මේ කටයුතුවලට සම්බන්ධ වී සිටිති. මෙයින් ගොවීන්ට සෙතක් සැලසෙන අතර, අනික් අතට බැංකුවලින් ගොවීන්ට උවමනා ට්‍රැක්ටර්, නිවාස, මී හරක්, කටුකම්බි, ස්ප්‍රේයර් යන්ත්‍ර, ගෘහ භාණ්ඩ, කරත්ත, රෝද 2 ට්‍රැක්ටර් යනාදිය මිලට ගැනීමට අමතර ණය ලබා දීමට ඉඩ ප්‍රස්ථා සලසා දී තිබේ. ගල්නෑව මහජන බැංකු ශාඛාව හා ග්‍රාමීය බැංකුව මගින් ගියමස වනවිට 60දෙනෙකුට අධික සංඛ්‍යාවකට රෝද 4 හා රෝද 2 ට්‍රැක්ටර් මිළ දී ගැනීමට අවශ්‍ය ණය පහසුකම් සලස්වා තිබේ. රෝද 4 ට්‍රැක්ටරයක වෙළඳපොළ මිළ රුපියල් ලක්‍ෂ යක් පමණද, රෝද දෙකේ ට්‍රැක්ටර් යක් රුපියල් විසි දහක්පමණ වන බව සලකන විට මහවැලි ගොවීන්ට සැලසී ඇති සෙත ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. දැනට ගොවීන්ට ලබා දී ඇති බැංකු ණය පිළිබඳ විස්තරයක් කවදුරටත් පහත සඳහන් වේ.

| ණය වර්ගය | ලබා ගත් ගොවීන් ගණන | ප්‍රමාණය |
|---|---|---|
| | | රු ශත |
| **ගල්නෑව මහජන බැංකු ශාඛාව** | | |
| බිම් කට්ටි සංවර්ධනය | 512 | 5,12,000·00 |
| රෝද 4 ට්‍රැක්ටර් ණය | 2 | 85,000·00 |
| කොන්ත්‍රාත් ණය | 1 | 3,000·00 |
| දුම් උඳුන් සඳහා | 26 | 1,30,000·00 |
| බර කරත්ත ණය | 6 | 18,600·00 |
| රෝද 2 ට්‍රැක්ටර් | 45 | 4,39,300·00 |
| **ග්‍රාමීය බැංකුව** | | |
| 77/78 මහ වගා ණය | 1,627 | 16,91,149·15 |
| 78 යල වගා ණය | 375 | 2,56,473·00 |
| 78 අතිරේක වගා ණය | 43 | 24,822·75 |
| කටු කම්බි මිළදී ගැනීමට | 264 | 1,31,486·00 |
| ස්ප්‍රේ යන්ත්‍ර මිළදී ගැනීමට | 11 | 8,085·00 |
| නිවාස ණය | 13 | 28,000·00 |
| පාරිභෝගික කටයුතු | 52 | 11,100·00 |

මහජන බැංකු ශාඛාවෙන් මහවැලි සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව ඉඩම් ඇපයක් මත පමණක් ගොවීන්ට රු. 5,000 ක් දක්වාද, ඊට වඩා පිළිගතහැකි ඇපයක් මත රු. 25,000ක් දක්වා ද නිවාස ණය ආදිය ලබා දීමට කටයුතු සලස්වා ඇත. මෙයට අමතරව වෙළඳ ව්‍යාපාර යනාදිය ආරම්භ කිරීමට උවමනා මූලික ධනය උදෙසා ගල්නෑව මහජන බැංකු ශාඛාව අතහිත දීමට සූදානම් ය. බුද්ධිමත්, ඒ වාගේ ම ඉදිරිපත් වීමේ ශක්තියකින් හෙබි ඕනෑම ජනපදික ගොවියෙකුට දියුණුවේ හිනිමං පෙත්තෙ ඉහළටම නැඟීමට ඉඩකඩ සැලසීමට බැංකු ශාඛාවෙන් සකස් කර ඇත්තේ කදිම වාතා-වරණයකි.

මෙසේ කෙරෙන කටයුතු හේතුවෙන් මේ පුරෝගාමී ජනපදිකයින්ට බැංකු මගින් ගණු දෙණු කිරීම පිළිබඳ සෑහෙන පලපුරුද්දක් ලබා ගතහැකිවී තිබේ. මේ අතින්ද එම වැඩ සටහන් ක්‍රියාත්මක කරන නිලධාරීන් සෑහෙන දුරට සෑහීමකට පත්කරවන ජයග්‍රහන ඔවුන් ලබා ඇත. අප එහි යන විට ගල්නෑව මහජන බැංකු ශාඛාවේ ගොවි මහත්වරුන්ගේගේ ඉතිරි කිරීම් තැන්පත් රුපියල් 1,180,000·00 ක් ද, ස්ථිර

තැන්පත් රු. 42,500·00 ක්ද අතර, සමුපකාර ග්‍රාමීය බැංකුවේ ඉතිරි කර ඇති ප්‍රමාණය රුපියල් 2,80,392·00 ක් විය.

බාල පරම්පරාව එනම්, පාසැල් සිසුවන්ට අනාගතය උදෙසා ඉතිරි කිරීමේ අගය වටහාදීමට ගල්නෑව නෙල්ලුපිටිය ආදී බැංකුවල පාසැල් ඉතිරි කිරීම ව්‍යාපාරයක් එම බැංකු ශාඛාව මගින් ආරම්භ කර තිබේ.

## අධ්‍යාපනය හා පාසැල්

**පාසැල්:** දරුවන් ගේ අධ්‍යාපන පහසුකම ගැන දන් ජනපදිකයින් කොයි කාගේත් හිත් යොමු වී ඇත. දන් පාසැල් 09 ක් පමණ මෙම ප්‍රදේශයේ ඇතිමුත් විශේෂයෙන් උසස් පංති ඇති පාසැල් වලට දුර බැහැර යෑමට සිදුව ඇත විශේෂයෙන් නගරාසන්න ප්‍රදේශවල මෙන් ගමනා ගමන පහසුකම නොමැති මේ ප්‍රදේශවල සැතපුම් 5,6 ගමන් කිරීම අපහසු කරුණකි. දනට විද්‍යාගාර, ගොඩනැගිලි යනාදිය සම්පූර්ණ කර ගෙන යන මේ පාසැල් වලට අමතරව කල්ලන්කුට්ටිය මධ්‍ය මහා විද්‍යාලයකුත්, බුල්නෑව හා හල්මිල්ලෑව මහ විදුහල් දෙකකුත් තනා දීමට දන් කටයුතු කර ගෙන යනු ලැබේ. මේ පාසැල් තැනෙන්නේ මහවැලි සංවර්ධන මණ්ඩලයේ වියදමිනි. මේ පාසැල් බොහොමයක දනට ඉගැන්වෙන්නේ 7-8 පංති දක්වා පමණක්වුවද, නොදුරු අනාගත යේදී ඒවා විශ්ව විද්‍යාල ප්‍රවේශය දක්වා ඉගැන්වීමට කටයුතු කෙරේ. දනට පවතින ප්‍රධාන ප්‍රශ්නයක්ව ඇත්තේ අවශ්‍ය ප්‍රමාණයට ගුරුවරුන් ලබා ගැනීමයි. විශේෂයෙන් මේ පාසැල්වල විද්‍යා ගුරු හිඟයක් පවතී. පාසැල්වල මේස පුටු, බංකු යනාදිය උදෙසා මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් රු. 3.50,000.00ක් වෙන් කර තිබේ.

## ගොවි නිපැයුම්

තවද, මහවැලි සංවර්ධන මණ්ඩලයේ සහයෝගය ඇතිව සර්වෝදය ව්‍යාපාරය මගින් පෙර පාසැල් ඇරඹීම උදෙසා ගුරු මෙනෙවියන් 14 දෙනෙකුට දනට පුහුණුව ලබා දී ඇත. සමාජයෙහි හික්මුණු දරුවන් බිහි කිරීම අරමුණු කොට ඉරු දින දහම් පාසැල් දනටමත් හල්මිල්ලෑව, අත්තරගම සහ මීගල්ලෑව පිහිටුවා ඇත

**ගොවි නිෂ්පාදිත අලෙවිය:** වී හැර අනෙක් බෝග නිෂ්පාදන විශාල ප්‍රමාණයක් ප්‍රදේශයේ නිපදවේ. විශේෂයෙන් වියළි කලාපයේ පවතින රතු පස ඇති කුඹුරු ඉඩම් වී වගාවට යෙදීමේ දී විශාල වාරිමාර්ග ජල ප්‍රමාණයක් යෙදවිය යුතු බැවින් ගොවින් කව්පි, මුං, මෑ, රටඑණු, මිරිස්, එළවළු වගා කිරීමට සාමාන්‍යයෙන් දිරි ගැන් වේ. මෙය ප්‍රදේශයේ අවශ්‍යතාවයන් පිරිමැසීමට මෙන් ම, ගොවීන්ට අතිරේක ආදයමක් ලබා ගැනීම උදෙසාත් ය. පසුගිය වකවානුවල රජය මගින් බෝග 21 කට පාදක මිලක් ලබා දීමට කටයුතු කරතිබේ. නමුත් මෙම ගොවි නිෂ්පාදන කලට වේලාවට වෙළදපොළට හා මිළදී ගන්නා තැන්වලට යැවීම අපහසුව ඇති නිසා නියම මිලක් ලබාගැනීම උගහටව ඇත. උදහරණයක් හැටියට පසුගිය මැයි,ජුනි මාසවල මෙම ප්‍රදේශයේ වැටකොළු රාත්තලක් ශත 15, තක්කාලි ශත 30,40 ට අලෙවි විය. වෙළදපොළ රතුළුණු රාත්තල 1.50 අලෙවි කරද්දී, ගොවින් රතුළුණු රාත්තල විකුණුවේ රු. 1.00 වත් අඩු වෙනි.

## අලෙවිය

මේ නිසා ගල්නෑව ප්‍රදේශයේ ගොවි නිෂ්පාදන මිළ දී ගැනීමේ වැඩ පිළිවෙලක් ප්‍රදේශයේ සමුපකාර සමිති මගින් ක්‍රියාත්මක කර ඇත. මේ මගින් අතිරේක ආහාර බෝග මිරිස් වැනිදේ දනට මිළදී ගනු ලබයි. තවද, මහවැලි සංවර්ධන මණ්ඩලයත් අලෙවි දෙපාර්තමේන්තුවත් එක්ව ගල්නෑව, බුල්නෑව, හුරිගස්වැව සහ මීගල්ලෑව යන ප්‍රදේශයන්හි ගොවීන්ගෙන් එළවළු මිළ දී ගෙන කොළඹ වෙළඳපොලට ප්‍රවාහනය කරනු ලැබේ.

මේ කටයුතුවලට අමතරව ඉරිද පොළවල් ගල්නෑව, බුල්නෑව, මීගල්ලෑව ඉතා ඉක්මණින් ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු දන් මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් සංවිධානය කර තිබේ.

**වෙළඳ මධ්‍යස්ථාන:** මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමයට පැමිණි බෝවතැන්න ආදී පළාත්වල ජනපදිකයන්ට ඒ කාලේ ගෙදර දොරට අවශ්‍ය දේවල් ලබා ගන්නට සැතපුම් 8-10 පයින් යන්නට සිදුවිය. දන් හැම නිවසකම සිට සැතපුම් 03 ක් ඇතුළත ඒ සේවාවන් සැපයීම නව ජනාවාස සැලසුම් යෝජනා ක්‍රම අනුව සලස්වා තිබේ ඒ වගේම මධ්‍යස්ථානවල වෙළඳාම් ආරම්භ කිරීමට උනන්දුවක් ඇති ගොවියනට ඉදි කිරීම සඳහා දන් වෙන්දේසි මගින් පර්චස් 12-16 බිම් කොටස් විකුණා තිබේ.

එම කඩ කාමර දැන් ඉදිවෙයි. මේ උදෙසා ව්‍යාපාරයෙන් පිටස්තර අයටද ඉඩකඩ දීමට දැන් සොයා බලා ගෙන යයි.

මේ විතරක් නොවේ, ජනපදිකයනට උවමනා රෝද 4 ට්‍රැක්ටරයේ සිට පැන්සලක් දක්වා වූ ඕනෑම භාණ්ඩයක් මිළදී ගත හැකි මහා වෙළඳ පොලවල් (සුපර් මාර්කට්) බුල්නෑව, ගල්නෑව, හුරිගස්වැව යනාදී ස්ථානවල පිහිටුවීමට ද කටයුතු යොදා ඇත.

## කර්මාන්ත

**සුළු කර්මාන්ත:** උදැල්ලක් තලවා ගන්න, බයිසිකලයක් රෙපයාර් කරවා ගන්න, ට්‍රැක්ටරයේ යන්ත්‍රය ආබාධයක් ඇති කළ පිළියම් කරගන්න, ඒත් නැතිනම් ගෙයක වහල සවිකර ගන්න, කාර්මිකයින්ගේ බාස්උන්නැලාගේ සේවය අවශ්‍ය ය. ඉතින් ජනපදිකයින් මේ උවමනාව පිරිමහගන්න හැකිවන පරිදි මේ සුළු කාර්මිකයින්ට සිය කර්මාන්ත පිහිටුවා ගන්න හැම දිරියක්ම ලබා දී තිබේ. පසුගිය ද මහවැලි සංවර්ධන මණ්ඩලය මගින් මේ නව ජනපදවල කළ සමීක්ෂණයකින් ප්‍රදේශයේ වඩු මෙසන් බාස්උන්නැහෙලා 100 ක්ද, බයිසිකල් නඩත්තු කරන්නන් 49 ක්ද, කම්මල්කරුවන් 185 ක්ද, මිකැනික්වරු 15 ක්ද, බක්කරවරු 19 ක්ද, කටයුතු කර ගෙන යන බව දැනගැනීම සැමගේ ධෛර්යට කාරණයක්විය. මොවුන්ගේ කටයුතු තව තවත් පුළුල් කිරීමටත් ඒ වගේ එබඳු ශිල්පීන් මේ ප්‍රදේශයේ තව තවත් ගෙන්වා පදිංචි කරවීමටත් මහවැලි සංවර්ධන මණ්ඩලය මඟින් උත්සාහ ගනී.

## ගොවි ආම්පන්න

**කෘෂිකාර්මික කටයුතු:** රටේ වී අස්වැන්න පසුගිය 10 වසර තුළ වසරකට සියයට 3.5 වේගයකින් වැඩි වී ගොස් තිබේ. දැනට රටේ සහල් අවශ්‍යතා 70% ක් පමණ සපුරා ලන්නේ දේශීය නිෂ්පාදන වලිනි. මේ තත්වය පස සහ ජලය කළමණාකරණය, බෝග පැලෑටි රක්ෂණය, ගොවිපල යන්ත්‍ර ආම්පන්න, ගොවිපල පාලනය වගේ අංශවල විශාල දියුණුවක් ඇතිව සිදු කරන ලද්දකි. මේ අනුව රට සහලින් ස්වයංපෝෂිත කිරීම උදෙසා විශාල පියවරක් මහවැලියේ ගොවීනට ගැනීමට සිදු වෙනවා ඇත.

අද 'එච්' ප්‍රදේශයේ පදිංචි වී සිටින ගොවීන් මුහුණ පාන ප්‍රධාන ගැටළුව කුඹුරු වැඩ සඳහා වාහන/යාන්ත්‍රික බලයේ ඇති උග්‍ර හිඟය යි. රෝද 04 ට්‍රැක්ටරයකින් සාමාන්‍යයෙන් කන්නයකට අක්කර 100 ක විතර සී සෑහාදී කටයුතු කළ හැකි යි. රෝද 2 ට්‍රැක්ටරයකින් කළ හැකි වනුයේ කන්නයකට අක්කර 30 50 ත් අතර ප්‍රමාණයකි. දැන් ගල්නෑව මහවැලි සංවර්ධන මධ්‍යස්ථානයේ පාලනය වන කුඹුරු අක්කර 9,700 කින් පසුගිය මහ කන්නයේ වැඩ කළ අක්කර 7,019ක කටයුතු කිරීමට ජනපදවාසීන් සතුව තිබුනේ රෝද දෙකේ ට්‍රැක්ටර් 37 ක් පමණි. දැනට ඇනවුම් කර ඇති ඉතිරි ට්‍රැක්ටර් ලැබෙන තුරු මේ ආකාරයට කටයුතු කර ගෙන යෑමට සිදුව ඇත. රෝද 2 ට්‍රැක්ටර් අයිතිකරුවන් වැඩි දෙනෙක් ඉන් තම කුඹුරු ඉඩම්වල වැඩ කර ගැනීම පමණක් සිදු කරනු ලබයි. එය ඊට තුඩු දුන් තවත් හේතුවකි. කෙසේ වුවත් වාණිජමය පදනමක් මත කටයුතු කිරීමට ඔවුන් යොමු නොවීමත් අනිත් අතට තම කුඹුරුවල කටයුතු කරනවා හැරෙන්නට අනිකුත් තැන්වලට යෑමට තරම් ඉස්පාසුවක් ඔවුනට නොතිබීමත් යන කරුණු දෙක විය හැකියි.

## වගා රටාව

මහවැලි සංවර්ධන කටයුතු ඇරඹීමට පෙර එහි හැම බිම් අඟලකම පස් සංයුතිය, වර්ගය ආදිය සිතියම් ගතකර තිබේ. ඒ ඒ පස් වර්ගය, පොළවේ පිහිටීම (තැන්නක්ද, බෑවුමක්ද ආදී අනුව) ඒ ඒ බෝග වර්ගද නිර්දේශ කර තිබේ. ඉතා හොඳින් දිය බැස යන පසෙහි වී වගා කිරීම වාරිමාර්ග ජලය අපතේ යෑමක් බැවින් ඒ පසෙහි උක්, මිරිස්, රටකජු, රතුළුණු හා එලවළු බඳු නිර්දේශිත බෝග කලින් සඳහන් කළාක් මෙන් ම වගා කිරීමට උනන්දු කරයි. තවමත් බොහොමයක් බෝග වලට සහතික මිළක් නොමැති වීමත්, සහතික මිලක් ඇති භෝගවලට ද ඒවා ලබා ගැනීමට ස්ථිර මාර්ග නොතිබීමත් ගොවීන් මුහුණ පාන ප්‍රශ්නයකි. දැන් ඉහත සඳහන් කුඹුරු අක්කර 9,700 කින් පමණ අක්කර 2,000 පමණ මේ රතු පස් ගණයට අයත් කුඹුරු ඉඩම් වේ අඩුම වශයෙන් මේ කුඹුරු ඉඩම් වලින් 50% වත් අතිරේක බෝග වගාවට ගෙන ඒමට හැකි වුවොත් එය ඔවුන්ගේ උත්සාහයේ සාර්ථක භාවයක් හැටියට සැලකිය හැකි වුවත් දැනට ගොවීන් වගා කරන්නේ ඉන් අක්කර 400කවූ අතිරේක බෝග වගාවක් පමණි.

ජනපදිකයින් ගේ මුල් ගම් පළාත් අනුව නව වගා පිළිවෙත් ප්‍රයෝජනවත් කර ගැනීම ද වෙනස් වූණි. උදහරණයක් හැටියට බෝවතැන්න, තෙල්දෙණිය ආදී පළාත්වලින් පැමිණි ගොවීන්ට අළුත් ක්‍රම භාවිතය ගැන හොඳ වැටහීමක් තිබුනි. මේ නිසා වඩා හොඳ අස්වැන්නක් ලබා ගැනීමට ඔවුනට හැකි වීය. ඇත්තවශයෙන් ම ඔවුන් ලබා ගත් අස්වැන්න සාමාන්‍යයෙන් අක්කරයක් සඳහා බුසල් 90 ක් වේ. නමුත් ගේන් ගොවිතැනට වැඩිමනත් ඇල්මක් දක් වූ පුරාණ ගම්වාසීන් ලබා ගත්තේ ඊට වඩා අඩු සාමාන්‍ය අස්වැන්නකි. ප්‍රදේශයේ ඉහත සඳහන් අන්දමේ සාමාන්‍ය මට්ටමක් වුව ද ලැබුවේ ගොයම් පැල සිටුවීම් ප්‍රමාණය අක්කර 1,000 ක පමණ සිදු කිරීමෙනි. මෙ නිසා වී ගොවිතැනින් විපුල අස්වැන්නක් ලැබීමට තවත් විශාල ඉඩකඩක් තිබේ. මහ කන්නයේ මේ කුඹුරුවලට යෙදූ පෝර ප්‍රමාණය මූලික පෝර භාණ්ඩර 1,100 ක් ද, යූරිය පෝර 14,000 ක්ද, වූයේ යැයි ඇස්තමේන්තු කර තිබේ. මෙය නිර්දේශිත තත්වයකට අනුකූල වූ වර්ගය හා ප්‍රමාණයකට ගෙන ඒමට දැන් උත්සාහ ගැනේ.

දැන් ප්‍රදේශයට උචිත ගොවිතැන් ක්‍රම හා උපකරන අත්හද බලා ගෙන යයි. මේ අනුව වැඩි දියුණු කළ නව පන්නයේ උපකරණයක් හැටියට 'ජෝන් පුල්ලේ' සීඩරය හඳුන්වා දිය හැක. මේ උපකරණය බීජ සිටු වීමත්, ඒ හේතු කොට වල් නෙලීමාදිය පහසුවීමත් නිසා ගොවීන් ගේ කාලය බොහෝ සේ ඉතිරි වේ. හැකි තරම් තනි ගොවියෙකුට තම කුඹුරු කටටිය සම්පූර්ණයෙන් ම ඉතා හොඳින් ගොවිතැන් කර ගැනීමට මෙබඳු වූ උපකරන ප්‍රයෝජනවත්ය.